## පළමුවන කියැවීම

උත්පත්ති 2:18-24

උත්පත්ති කථාවෙන් ගත් පාඨයෙකි.

**" ඔව්හු එක්කෙනෙක් ම වන්නෝ ය."**

දෙවි සමිඳුණන් වහන්සේ කතා කොට, "මිනිසා තනිව විසීම සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි" යි වදාළ සේක. මෙසේ උන් වහන්සේ පොළොවේ පසින් වනයේ සියලු සතුන් ද අහසේ සියලු පක්ෂීන් ද මැවූ සේක. ඉන්පසු මිනිසා උන්ට කුමන නම් තබන්නේ ද යි බලනු පිණිස උන් මිනිසා වෙත ගෙනා සේක. මිනිසා එක එකාට තැබූ නාම, උන්ගේ නාම විය. මෙසේ මිනිසා සියලු ගව මහීෂයන්ට ද අහසේ පක්ෂීන්ට ද සියලු මෘගයන්ට ද නම් තැබී ය. එහෙත්, ඔහුට සුදුසු සහකාරියක් නොවූවා ය. එවිට දෙවි සමිඳුණන් වහන්සේ මිනිසා බර නින්දකට පත් කළ සේක. ඔහු නිදා සිටිය දී උන් වහන්සේ ඔහුගේ ඉළ ඇටවලින් එකක් ගෙන ඒ ස්ථානය වසා දැමූ සේක. උන් වහන්සේ ඔහුගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රියක මවා ඔහු වෙත ගෙනා සේක. එවිට මිනිසා කතා කොට, "දැන් ඉතින් මාගේ ඇටවලින් ගත් ඇටය වන, මාගේ මාංශයෙන් ගත් මාංශය වන මැය, මිනිසාගෙන් ගත් හෙයින් ඇට 'ස්ත්‍රී' කියා කියනු ඇතැ"යි පැවසී ය. මිනිසෙකු තම පියා ද මව ද අත්හැර සිය භාර්යාවට බැඳෙන්නේ එබැවින් ය. මෙලෙස ඔව්හු එක්කෙනෙක් වන්නෝ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 128:1-6

පිළිතුර: සමිඳුණෝ අපව ආශිර්වාද කරන සේක්වා!.

ගීය: සමිඳුන් කෙරෙහි ගරු බිය ඇති, එතුමන්ගේ මාර්ගයෙහි හැසිරෙන සියල්ලෝ භාග්‍යවන්තයෝ ය. මන්ද, ඔබේ ශ්‍රම ශක්තියේ ප්‍රතිඵලය ඔබ භුක්ති විඳින්නෙහි ය. ඔබ වාසනාවන්ත ය. ඔබට ශුභ සිද්ධ වන්නේ ය.

ඔබේ බිරිඳ ඔබේ නිවෙස තුළ පල දෙන මිදිවැලක් මෙන් වන්නී ය. ඔබේ දරුවෝ ඔබේ මේසය වටා ඔලීව පැළ මෙන් වන්නෝ ය. සමිඳුන් කෙරෙහි ගරු බිය දක්වන්නා මෙසේ ආසිරි ලබන්නේ ය.

සමිඳුණෝ සියොන්හි සිට ඔබට ආශිර්වාද කරන සේක්වා! ඔබේ මුළු ජීවිත කාලයේ දී ජෙරුසලමේ සුබ සෙත ඔබට දක්නට ලැබේවා! ඔබේ දරු මුනුබුරන් දකින්නට ලැබේවා! ඉශ්රායෙල් සෙනගට සාමය වේවා!

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 2:9-11

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"පිරිසිදු කරන්නා ද, පිරිසිදු කරනු ලබන්නෝ ද එකම පියාණන් වහන්සේගෙන් වෙති."**

අපට පෙනෙන්නේ, දෙවියන් වහන්සේගේ කරුණාවෙන් සියල්ලන් උදෙසා දිවි පුදන පිණිස, දේව දූතයන්ට වඩා මඳක් පහත් කරනු ලැබූ නමුත්, දිවි පිදූ නිසා, ගෞරවය

නැමති කිරුළ පැළඳ සිටින ජේසුස් වහන්සේ ය. මන්ද, බොහෝ පුත්‍රයන් තේජසට ගෙන යන කල, ඔවුන්ගේ විමුක්තිදායකයාණන් වහන්සේ දුක් විඳීමෙන් පරිපූර්ණ කිරීමට, සියල්ල මවා ආරක්ෂා කරන දෙවියන් වහන්සේට යුතුව තිබිණි. මන්ද, පිරිසිදු කරන්නා ද කරනු ලබන්නෝ ද යන සියල්ලෝ ම එකම පියාණන් වහන්සේගෙන් වෙති. ඒ කාරණය නිසා ජේසුස් වහන්සේ ඔවුන්ට සහෝදරයන් යයි කීමට ලජ්ජා නොවන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ජුවාම් 17:17

ආලේලූයා! ආලේලූයා!
සත්‍යය නම් ඔබගේ ධර්මය ය. සත්‍යයෙහි අප කැප කළ මැනව.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 10:2-16

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"දෙවියන් වහන්සේ එක්කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා."**

පරිසිවරු අවුත් ජේසුස් වහන්සේ වචනයකින් අල්ලාගනු පිණිස, "පුරුෂයෙකු විසින් සිය භාර්යාව දික්කසාද කිරීම නීතියට අනුකූල දැ"යි උන් වහන්සේගෙන් ප්‍රශ්න කළහ. උන් වහන්සේ උත්තර දෙමින්, "මෝසෙස් ඔබට කුමක් අණ කෙළේ දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. "දික්කසාද සහතිකයක් ලියා ඇය අත්හැර දමන්න මෝසෙස් අවසර දුන්නේ ය"යි ඔව්හු කී හ. එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට, "ඔහු මේ ආඥා පැණවූයේ, ඔබේ සිත් දැඩිකම නිසා ය. එහෙත්, මැවීමේ මුල සිට ම දෙවියන් වහන්සේ ඔවුන් ස්ත්‍රී-පුරුෂ වශයෙන් මැවූ සේක. ඒ හේතුකොට ගෙන මිනිසෙක් තම පියා ද මව ද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ යුවළ ද එක ම මාංසයක් වෙති. මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙක් නොව එක් කෙනෙක් වන්නෝ ය. එබැවින් දෙවියන් වහන්සේ එක්කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේ වා!"යි වදාළ සේක. ශ්‍රාවකයෝ ගෙදර දී මේ කාරණය ගැන යළිත් උන් වහන්සේගෙන් ඇසූ හ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "සිය භාර්යාව අත්හැර වෙන ස්ත්‍රියක පාවාගන්න කවරෙකු නමුත් ඔහු ඈට විරුද්ධ ව කාමමිථ්‍යාචාරය කරයි. ස්ත්‍රියක් ඇගේ පුරුෂයා අත්හැර වෙන කෙනෙකු සරණ පාවා ගන්නී නම්, ඈ ද කාමමිථ්‍යාචාරය කරන්නී ය"යි වදාළ සේක. (සමහරු තමන්ගේ ළදරුවන් පිට ජේසුස් වහන්සේගේ අත් තබවා ගන්නා පිණිස, උන් වහන්සේ වෙත ඔවුන් ගෙනාහ. එවිට ශ්‍රාවකයෝ ඔවුන්ට තරවටු කළහ. ජේසුස් වහන්සේ ඒ දැක ඉතා අමනාප වී, "ළදරුවන්ට මා වෙත එන්න ඉඩ හරින්න: ඔවුන් නොවළක්වන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තක ය. සැබැවින් ම මම ඔබට කියමි, යම් කෙනෙකු දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළදරුවෙකු සේ නොපිළිගත්තොත්, ඔහු කිසි සේත් එහි ඇතුළු නොවන්නේ ය"යි ඔවුන්ට වදාළ සේක. උන් වහන්සේ ඔවුන් තුරුළු කරගෙන ඔවුන් පිට අත තබා ඔවුන්ට ආශිර්වාද කළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.